වාරය - 02

| | | |
|---|---|---|
| ශ්‍රේණිය :10 | විෂයය :ගෘහ ආර්ථික විද්‍යාව | පාඩම : නිපුණතාව 10<br>ගෘහීය අවශ්‍යතා සඳහා මැහුම් ක්‍රම භාවිතයෙන් උපාංග සකස් කිරීම |

නිපුණතා මට්ටම - විවිධ මැහුම් භාවිතයෙන් එදිනෙදා ප්‍රයෝජනවත් වන සරල උපාංග නිර්මාණය කරයි.

- උපාංග යනු - යම්කිසි ස්ථානයක ප්‍රධාන ගෘහභාණ්ඩ වලට අමතරව අලංකාරය ඇතිකිරීමට හෝ අලංකාරය හා ක්‍රියානුරූපී බව ඇතිකිරීමට භාවිතා කරන ලද දෑ වේ.

- උපාංග භාවිතයෙන් - නිවස තුළ සජීවී , බවක් ක්‍රියාශීලී බවක් , නිර්මාණාත්මක බවක් ක්‍රියානුරූපීව ඇතිවේ

- ක්‍රියානුරූපී බව යනු - නිර්මාණයකින් ඉටු විය යුතු කාර්යය නිසිපරිදි ඉටුවන සේ සැකසී තිබීමයි

- නිර්මාණාත්මකව සැකසිය හැකි ගෘහ උපාංග වලට උදාහරණ කීපයක් පහත ඇත

  උදා :- ලියුම් රඳවනය / බිත්ති සැරසිලි / අත්පිස්නා රඳවනය / ශීතකරණ අල්ලුව / කුශන් කවර





කුශන් කවර මෝස්තර




අත් පිස්නා රඳවනය



බිත්ති සැරසිලි

## <u>පිරිසැලසුම......</u>

- උපාංගයක් නිර්මාණය කිරීමට ප්‍රථම ඒ සඳහා පතොරමක් සකස් කිරීම , සුදුසු

රෙදිවර්ගය හා අවශ්‍ය ප්‍රමාණය තීරණය කිරීම , රෙදි වර්ග හා ඒවායේ වර්ණ ගැලපීම , මැසීමට ගනු ලබන නූල් වර්ග හා එහි වර්ණ ගැලපීම යන කරුණු තීරණය කළ යුතුව ඇත. මෙම කරුණු ඇතුළත් දළ සැකැස්ම " පිරිසැලසුම" නම් වේ.

